**DIABETES ASSOCIATION OF SRI LANKA**
**NATIONAL DIABETES CENTRE**
50, Sarana Mawatha, Kotte Road, Rajagiriya, Sri Lanka
**Tel:** +94 11 2872951-2 / 2883318 **Fax:** +94 11 2872952
**E-mail:** dasl@sltnet.lk **Web:** www.diabetessrilanka.org

unite for diabetes

# අනුමැතිය ලබාගැනීමේ පත්‍රිකාව

**ව්‍යාපෘති මාතෘකාව:** ශ්‍රී ලංකාවේ පලවන ගණයේ දියවැඩියාව සහිත පුද්ගලයන්ගේ නාමලේඛනයක් ප්‍රවර්ධනය කිරීම

**ප්‍රධාන විමර්ශක:** **වෛද්‍ය මහේන්ද්‍ර අරුණශාන්ති විජේසූරිය**
දු:ක. 0773021666
ඊ-මේල්:amrit@slt.lk / dasl@sltnet.lk

පලවන ගණයේ දියවැඩියාවෙන් පෙලෙන ඔබ විසින්ම ඔබගේ නම ජාතික ලැයිස්තුවකට ඇතුලත් කිරීමේ මහඟු කර්තව්‍යට දායක වීමට ශ්‍රී ලංකා දියවැඩියා සංගමයේ ගරු ලේකම් සහ ජාතික දියවැඩියා මධ්‍යස්ථානයේ ගරු අධ්‍යක්ෂ වෛද්‍ය මහේන්ද්‍ර අරුණශාන්ති විජේසූරිය මහතා ඔබට ආරාධනා කර සිටී. මෙම මහඟු කර්තව්‍යට ඔබ දක්වන සහයෝගය අප ඉතා අගය කොට සළකමු.

## 1. අධ්‍යනයේ අරමුණ

මෙහි ප්‍රධාන අරමුණ වනුයේ, වර්ථමානයේ සහ අනාගතයේ ශ්‍රී ලංකාව තුල පලවන ගණයේ දියවැඩියා ව්‍යාප්තිය, ප්‍රමාණය, රෝගාතුරබව සහ මරණ සංඛ්‍යාව නිවැරදිව නිර්ණය කර ගැනීමයි. මෙතෙක් ශ්‍රී ලංකාව තුල මෙවැනි පලවන ගණයේ දියවැඩියාව සහිත වූවන්ගේ නාමලේකනයක් සකස් කොට නැත.

## 2. ස්වේච්චා සහභාගීත්වය

මේ සඳහා ඔබගේ දායකත්වය ස්වේච්චාවෙනි. අධ්‍යනයට සහභාගී වීමෙන් වැළකී සිටීමටද ඔබට හැක. කෙසේ වුවද මේ සඳහා ඔබ ඔබගේ අනුමැතිය ජාතික දියවැඩියා සංගමය වෙත ලබා දුන්නද ඔබ කැමති ඕනෑම වේලාවක ඔබගේ තොරතුරු නැවත ඉවත් කර ගැනීමටද ඔබට හැක. එසේම ඔබ මේ සඳහා අනුමැතිය ලබා නොදුන්නද ඔබගේ ප්‍රතිකාර සහ වෛද්‍යාවරණය පෙර පරිදිම සිදුවන බව කරුණාවෙන් සලකන්න.

## 3. අධ්‍යනයේ ක්‍රියා පටිපාටිය, කාලය සහ සහභාගී වන්නන්ගේ වගකීම්

ඔබ මේ සඳහා දායක වීමට එකඟ වුවහොත්, සායනයේදී ඔබගේ වෛද්‍යවරයා විසින් ඔබව ඉතා සරල ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් මිනිත්තු 10-15 ක සම්මුඛ සාකච්චාවක් සඳහා යොමු කරනු ලබයි. එම සම්මුඛ සාකච්චාවට ඔබගේ පෞද්ගලික තොරතුරු, ජනගහන ව්‍යාප්ති තොරතුරු, සමාජ-ආර්ථික ගැටළු සහ සායනික තොරතුරු ඇතුලත් වේ. යම් හේතුවක් නිසා ඔබ පිළිතුරු දීමට අකමැති ප්‍රශ්නයක් වෙතොත් එය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඔබ සතුය.

## 4. ප්‍රතිලාභ

මේ සඳහා සහභාගී වීමෙන් ඔබට ලබාගතහැකි ප්‍රතිලාභ,

**DIABETES ASSOCIATION OF SRI LANKA**
**NATIONAL DIABETES CENTRE**
50, Sarana Mawatha, Kotte Road, Rajagiriya, Sri Lanka
**Tel:** +94 11 2872951-2 / 2883318 **Fax:** +94 11 2872952
**E-mail:** dasl@sltnet.lk **Web:** www.diabetessrilanka.org

unite for diabetes

- රෝග ව්‍යාප්තිය, රෝගයට ගොදුරු වීමේ ප්‍රතිශතයන් වැනි දත්ත ලබා ගැනීම තුලින් රෝගය වළකා ගැනීම සහ නිසි ප්‍රතිකාර ලබාදීම හරහා රෝගයේ සංකූලතා අවම කර ගැනීමට හැකි වීම

**5. අධ්‍යනයට සහභාගී වීමේ අවධානම**

මෙම අධ්‍යනයට සහභාගී වීමෙන් කිසිඳු අවධානම් තත්වයක් හෝ උවදුරක් ඇති නොවේ.

**6. ප්‍රතිපූරණය**

නොමැත

**7. විශ්වාසනීය බව / රහස්‍යභාවය**

ලබා දෙන සියලු දත්තයන්ගේ සුරක්ෂිතබව සඳහා සහතික වන අතර කිසිඳු හේතුවක් නිසා හෝ සමීක්ෂණ, ප්‍රකාශන ආදිය සඳහා ඔබගේ අනන්‍යතාව හෙළි නොවනු ඇත.

**8. අධ්‍යනය නිමා කිරීම**

ඔබ ලබාදෙන අනුමැතිය ඕනෑම වෙලාවක සංගමයේ ප්‍රධානියා දැනුවත් කිරීමෙන් ඉවත් කර ගත හැකි අතර එමගින් ඔබට ලබාදෙන ප්‍රතිකාර වල කිසිඳු අඩුවක් සිදු නොවේ.

**9. පැහැදිලි කිරීම**

අධ්‍යනය පිළිබඳ අපැහැදිලි තැන් ඇත්නම් ඒ සඳහා 011 2872951/2872952/2883318 ඇමතීමෙන් ඔබගේ ගැටළු යොමු කල හැක.